අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026) සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය	**81**	**S**	**I**	**පැය තුනයි**

උපදෙස් :

1. **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2. 1 සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
3. උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
4. උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

01. පහත සාධක අතුරින් ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන සාධක වන්නේ,

A. ආහාර සුලබ වීම

B. ආහාර ප්‍රයෝජනයට ගත හැකි වීම

C. ආහාර සපයා ගැනීම සඳහා ප්‍රවේශ වීමේ හැකියාව

D. විදේශ විනිමය උපයාගත හැකි වීම

1. A, B හා D ය.
2. A, C හා D ය.
3. B, C හා D ය.
4. A, B හා C ය.

02. පහත රූප සටහනෙහි දක්වා ඇත්තේ කාලගුණික මධ්‍යස්ථානයක සුළං දිශා දර්ශකයක් පිහිටුවා ඇති ආකාරයයි.



මෙම අවස්ථාවේ සුළං හමන දිශාව වන්නේ,

1. ගිනිකොණ සිට වයඹ දෙසට ය.
2. ඊසාන සිට නිරිත දෙසට ය.
3. වයඹ සිට ගිනිකොණ දෙසට ය.
4. නිරිත සිට ඊසාන දෙසට ය.

03. වර්ෂා ජලයෙන් වී වගා කරන ප්‍රදේශයක යල කන්නය සඳහා බිම් සකස් කිරීමට සුදුසු කාලය වන්නේ,

1. මාර්තු සිට අප්‍රේල් දක්වා ය.
2. මැයි සිට ජූනි දක්වා ය.
3. පෙබරවාරි සිට මාර්තු දක්වා ය.
4. අප්‍රේල් සිට මැයි දක්වා ය.

(දෙවැනි පිටුව බලන්න)

04. පහත පාෂාණ සඳහා උදාහරණ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

	පාෂාණ වර්ගය	උදාහරණය
1	ආග්නේය	වැලිගල්
2	අවසාදිත	පෙග්මටයිට්
3	ආග්නේය	ෂේල්
4	විපරිත	නයිස්

පහත දක්වා ඇත්තේ පාංශු පැතිකඩක රූප සටහනකි. 05 හා 06 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට එය භාවිත කරන්න.



3.5 රූපය - දර්ශීය පාංශු පැතිකඩක්

05. රූපයේ A සිට R දක්වා කොටස් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

	A	B	C	R
1.	විශෝධන	සංචායක	මාතෘ පාෂාණය	මාතෘ ද්‍රව්‍ය
2.	කාබනික	සංචායක	මාතෘ ද්‍රව්‍ය	මාතෘ පාෂාණය
3.	විශෝධන	සංචායක	මාතෘ ද්‍රව්‍ය	මාතෘ පාෂාණය
4.	සංචායක	විශෝධන	මාතෘ පාෂාණය	මාතෘ ද්‍රව්‍ය

06. “O” ස්ථරය පැහැදිලිව දැක ගත හැකි ස්ථානයක් ලෙස සැලකිය හැක්කේ,

1. පාසලේ ගොවිපොළ පවතින භූමියක ය.
2. වියළි කලාපයේ අතිරේක බෝග වගා කරන භූමියක ය.
3. සංරක්ෂිත වනාන්තරයක ය.
4. වී වගා කරන භූමියක ය.

(තුන්වැනි පිටුව බලන්න)

07. පසේ ආම්ලිකතාව සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

A - ආම්ලික පසේ pH අගය 4.5 - 6.5 දක්වා පමණ වේ.

B - තෙත් කලාපයේ පස ආම්ලිකවීමට ප්‍රධාන හේතුව වන්නේ, අධික වර්ෂාපතනය නිසා පසේ ඇති භාෂ්මික අයන ක්ෂරණය වීම ය.

C - අධික ආම්ලිකතාව ඇතිවිට ලවණවල ද්‍රාව්‍යතාව වැඩිවීම බෝග වර්ධනයට උපකාරී වේ.

D - කඳුකරයේ තේ ඉඩම්වලට ඩොලමයිට් යෙදීමෙන් ආම්ලිකතාව අඩුකර ගත හැකි ය.

1. A හා B යන ප්‍රකාශ පමණක් සත්‍ය වේ.
2. C හා D යන ප්‍රකාශ පමණක් සත්‍ය වේ.
3. A, B, C යන ප්‍රකාශ තුනම සත්‍ය වේ.
4. A, B, D යන ප්‍රකාශ තුනම සත්‍ය වේ.

08. බණ්ඩක්කා වගාවේ කපු කිනිස්ස බෝගය ධාරක ශාකය ලෙස යොදා ගෙන පාලනය කරනු ලබන කෘමි පළිබෝධකය,

1. පස්මුළු මකුණා ය.
2. රතු කපු මකුණා ය.
3. එපිලැක්නා කුරුමිණියා ය.
4. අවුලකපෝරා කුරුමිණියා ය.

09. යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන ද්විතියික බිම් සැකසීමේ උපකරණ යුගලය වන්නේ,

1. තැටි නඟුල හා ඇලිවැටි දමනය ය.
2. හැඩ ලැලි නඟුල හා ජපන් රොටරි වීඩරය ය.
3. ඇණ දත් පෝරුව හා තුන් පුරුක් කල්ටිවේටරය ය.
4. රොටවේටරය හා තල පෝරුව ය.

10. පහත වගුවේ සඳහන් කෘෂි උපකරණ ක්‍රියාත්මක කරවන අවස්ථා හා යොදන බලය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

	උපකරණය	ක්‍රියාකරවන අවස්ථාව	යොදන බලය
01.	සැහැල්ලු යකඩ නඟුල	ප්‍රාථමික බිම් සැකසීම	සත්ත්ව බලය
02.	රොටවේටරය	අතුරුයත් ගෑම	යන්ත්‍ර බලය
03.	ජපන් රොටරි වීඩරය	අතුරුයත් ගෑම	යන්ත්‍ර බලය
04.	ඇණ දත් පෝරුව	ද්විතීයික බිම් සැකසීම	සත්ත්ව බලය

11. නොරිදෝකෝ තවානේ පතුළට සිහින් වැලි තට්ටුවක් හෝ අඩක් පිළිස්සූ දහයියා යෙදීමේ අරමුණ වන්නේ,

1. ජලවහනය සාර්ථකව සිදුවීමට ය.
2. දිලීර රෝග ව්‍යාප්තිය පාලනයට ය.
3. තවාන් කුට්ටි පහසුවෙන් වෙන් කර ගැනීමට ය.
4. තවාන් පතුළෙහි ජලය රඳවා ගැනීමට ය.

(හතරවෙනි පිටුව බලන්න)

12. පිළිස්සීම මගින් තවාන් ජීවාණුහරණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සුළඟ හමායන දිශාව දෙසට තවානෙහි කෙළවරට ගිනි තැබීම
B - තවානේ මතු පිට පිදුරු සහ දහයියා තට්ටු කිහිපයක් මාරුවෙන් මාරුවෙන් මාරුවට ඇතිරීම
C - පිළිස්සීමට පෙර තවාන් මිශ්‍රණයට ජලය එක් කර තෙත් කිරීම
ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ තෝරන්න

1. A හා B පමණි.
2. B හා C පමණි.
3. A හා C පමණි.
4. A, B, C සියල්ලම ය.

13. 'ඍෂ්ධීය ජල සම්පාදන ක්‍රම' පමණක් අන්තර්ගත වී ඇති වරණය තෝරන්න.

1. ඉසින ජල සම්පාදනය හා බිංදු ජල සම්පාදනය
2. සවිවර නළ යෙදීම හා බේසම් ජල සම්පාදනය
3. පිටාර ජල සම්පාදනය හා තීරු ජල සම්පාදනය
4. ඇලි හා වැටි ජල සම්පාදනය හා බිංදු ජල සම්පාදනය

14. ජලවහනය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දුර්වල ජලවහනය නිසා, ලවණ වර්ග එක් රැස්වීමෙන් පසේ රසායනික ගුණාංග පිරිහීම සිදුවේ.
B - කොඩොල් කාණු ක්‍රමය හා ජල පොම්ප මගින් ජලය ඉවත් කිරීම භූගත ජලවහන ක්‍රම වේ.
C - දුර්වල ජලවහන තත්ත්ව යටතේ දී කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් මීතේන් වැනි වායු නිෂ්පාදනය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි පිළිතුර වන්නේ,

1. A හා B වේ.
2. B හා C වේ.
3. A හා C වේ.
4. A හා B හා C වේ.

15. පොස්පරස් මූල ද්‍රව්‍ය අඩුවීම නිසා ශාකවල පහත දැක්වෙන කුමන ඌනතා ලක්ෂණය නිරීක්ෂණය කළ හැකි ද?

1. ශාක කුරු වී මල් හා ඵල විකෘති වීම
2. පත්‍ර දාර කහ පාට වීම
3. ශාකවල මේරූ පත්‍ර දම් පාට වීම
4. පත්‍ර දාර පිළිස්සුණු ස්වභාවයක් ගැනීම

16. පොටෑසියම් (K), නයිට්‍රජන් (N) හා පොස්පරස් (P) අඩංගු පොහොර වර්ග වන්නේ පිළිවෙලින්,

1. යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ්, රොක් පොස්පේට් වේ.
2. මියුරියේට් ඔෆ් පොටෑෂ්, යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට් වේ.
3. රොක් පොස්පේට්, යූරියා, සල්ෆේට් ඔෆ් පොටෑෂ් වේ.
4. මියුරියේට් ඔෆ් පොටෑෂ්, ත්‍රිත්ව සුපර් පොස්පේට්, යූරියා වේ.

(පස්වෙනි පිටුව බලන්න)

17. වල් පැළෑටි සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A - වල් පැළෑටි ශීඝ්‍රයෙන් පැතිරෙන අතර අහිතකර කාලවල දී නොනැසී පවතී.
B - සමහර වල් පැළෑටි කෘෂිකර්මයේදී හානිදායක වුව ද වෙනත් විවිධ ප්‍රයෝජන ද ලබා ගත හැකි ය .
C - ගඳපාන, විඩේලියා, පාතිනියම් ආක්‍රමණශීලී වල් පැළෑටි සඳහා උදාහරණ වේ.

1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. A, B හා C පමණි.

18. පහත සඳහන් කෘමීන් හානි කරනු ලබන බෝග වර්ගය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

	කෘමියා	හානි කරන බෝගය
1.	දුඹුරු පැළ කීඩෑවා	වී
2.	පලතුරු මැස්සා	කුකර්බිටේසියේ බෝග
3.	රතු පොල් කුරුමිණියා	සොලනේසියේ බෝග
4.	අවුලකපෝරා කුරුමිණියා	පොල්

19. සොලනේසියේ කුලයේ බෝගවලට බහුල ව වැළඳෙන රෝගයක් වන්නේ,
1. ඇන්ත්‍රැක්සෝන් රෝගය ය.
2. දියමලන්කෑමේ රෝගය ය.
3. හිටුමැරීමේ රෝගය ය.
4. පත්‍ර විචිත්‍රය රෝගය .

20. BW 351 (මාස 3 1/2) වී ප්‍රභේදයේ වර්ධක අවධිය වන්නේ,

1. දින 60 ය.
2. දින 30 ය.
3. දින 35 ය.
4. දින 45 ය.

21. වී වගාවට බහුල ව වැළඳෙන කොපු අංගමාරය රෝගයේ රෝග කාරකය වන්නේ,

1. වෛරස් ය.
2. දිලීර ය.
3. බැක්ටීරියා ය.
4. ෆයිටොප්ලාස්මා ය.

22. බීජ සුප්තතාවට බලපාන කරුණු සහ ඒවාට අදාළ උදාහරණ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. බීජාවරණයේ වර්ධක නිශේධක පැවතීම - පැපොල් හා සියඹලා
2. ඝනකම් බීජාවරණයක් පැවතීම - අඹ හා වම්බටු
3. බීජාවරණය ජලයට හා වාතයට අපාරගම්‍ය වීම - දඹල හා සියඹලා
4. පරිණත නොවූ කලලය - පැපොල් හා අඹ

(හයවෙනි පිටුව බලන්න)

23. බද්ධ කිරීම සඳහා සුදුසු අනුජයක් තෝරා ගැනීම සම්බන්ධ සාධක කිහිපයක් පහත දැක්වේ.

A. අනුජය හා ග්‍රාහකය එකම ශාක කුලයකටම අයත් වීම
B. අහිතකර පාංශු පරිසර තත්ත්වවලට ඔරොත්තු දීම
C. අනුජය සක්‍රිය වීමට ආසන්න අවස්ථාවේ පැවතීම
D. උසස් ගුණාත්මක හා වැඩි අස්වනු ලබා දෙන ප්‍රභේද වීම

මින් නිවැරදි සාධක වන්නේ,

1. A , B හා C පමණි.
2. B , C හා D පමණි.
3. A, B හා D පමණි.
4. A, C හා D පමණි.

24. ඒකබීජ පත්‍රී බීජයක හා ද්විබීජ පත්‍රී බීජයක ආහාර සංචිත කර තබා ගන්නා කොටස් පිළිවෙලින්,

1. බීජ පත්‍ර හා බීජ මූලය ය.
2. භ්‍රෑණ පෝෂය සහ බීජ පත්‍ර ය.
3. බීජ පත්‍ර සහ භ්‍රෑණ පෝෂ ය.
4. බීජාංකුරය සහ බීජ මූලය ය.

25. මුල් ගිල් වූ වගාවක් සඳහා සකස් කරන ස්ටයිරෆෝම් පෙට්ටියක පතුළට කලු පොලිතීන් ආවරණයක් යෙදීමේ අරමුණ වන්නේ,

1. පෝෂක අඩංගු ජලය පිටතට කාන්දු වීම වැළැක්වීමට ය.
2. ස්ටයිරෆෝම් පෙට්ටිය දිරාපත්වීම අවම කිරීම ය.
3. මුල් වර්ධනය සඳහා උචිත උෂ්ණත්වය පවත්වා ගැනීම සඳහා ය.
4. දිලීර වර්ධනය හැකිතාක් අවම මට්ටමක පවත්වා ගැනීමට ය.

26. පහත සඳහන් තත්ත්ව අතරින් නිර්පාංශු වගාවේ දී පෝෂණ මාධ්‍යයක පැවතිය යුතු තත්ත්ව තෝරා දක්වන්න.

A. මාධ්‍යයේ pH අගය 5.8 - 6.5 අතර වීම
B. රෝපණ මාධ්‍යය ජීවානුහරණය කිරීම අත්‍යවශ්‍ය නොවීම
C. මාධ්‍යයේ විද්‍යුත්සන්නායකතාව මීටරයට ඩෙසි සීමන් 1.5- 2.5 අතර වීම

නිවැරදි තත්ත්ව වන්නේ,

1) A හා B පමණි.
2) A හා C පමණි.
3) B හා C පමණි.
4) A , B හා C පමණි.

27. හේන් ගොවිතැනෙහි පියවරවලට අදාළ කාල වකවානුව නිවැරදිව දක්වා ඇති වරණය තෝරා දක්වන්න.

1. බීජ සිටුවීම හෝ වැපිරීම - අගෝස්තු සිට සැප්තැම්බර් මැද දක්වා.
2. කැලෑව ගිනි තැබීම - ජූලි සිට අගෝස්තු දක්වා
3. දඬු වැට සකස් කිරීම - සැප්තැම්බර් මැද සිට බෝග සංස්ථාපනය කරන තුරු
4. අස්වනු නෙළා ගැනීම - සැප්තැම්බර් අග සිට අස්වනු නෙළා අවසන් වන තුරු

(හත්වෙනි පිටුව බලන්න)

28. බෝගයක අස්වනු මේරීමේ සිට එය පරිභෝජනය දක්වා ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

A - අස්වනු ගබඩා කිරීම　　B - අස්වනු අලෙවි කිරීම　　C - අස්වනු ප්‍රවාහනය
D - අස්වනු නෙළීම　　E - අස්වනු සැකසීම　　F - අස්වනු ඇසිරීම

1. A, B, C, D, E, F
2. D, E, B, C, A, F
3. D, E, F, C, A, B
4. B, D, F, E, A, C

29. ජල අද්‍රාව්‍ය විටමින් කාණ්ඩ වන්නේ,

1. B, D, E ය.　　3. A, D, E ය.
2. C, D, K ය.　　4. B, C, K ය.

30. පැස්චරීකරණය හා ජීවාණුහරණය යන ක්‍රියාවලි සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර ඇතුළත් වන වරණය තෝරා දක්වන්න.

	පැස්චරීකරණය	ජීවාණුහරණය
1.	දින 20-30 අතර ආහාර කල් තබා ගත හැකි ය.	මාස 8 – 12 පමණ කල් තබා ගත හැකි ය.
2.	ක්ෂුද්‍ර ජීවීන්ගේ බීජාණු පමණක් විනාශ වේ.	ක්ෂුද්‍ර ජීවීන් පමණක් විනාශ වේ.
3.	ක්ෂුද්‍ර ජීවීන් පමණක් විනාශ වේ.	ක්ෂුද්‍ර ජීවීන් හා බීජාණු යන දෙවර්ගයම විනාශ වේ.
4.	පැස්චරීකරණය කළ හැකි ආකාර එකකි.	ජීවාණුහරණය කළ හැකි ආකාර දෙකකි.

31. *Aspergillus flavus* නම් දිලීරය මගින් නිපදවන Aflatoxin නම් විෂ ඇති විය හැකි ආහාර වර්ග කිහිපයක් වන්නේ,

1. රටකජු, බඩ ඉරිඟු හා වියළි මිරිස් ය.
2. කිරි ආහාර, පාන් හා රටකජු ය.
3. ධාන්‍ය, බිත්තර හා කිරි ය.
4. මස් වර්ග, රට කජු හා ධාන්‍ය ය.

32. ආහාරවල 'අගය වැඩි කිරීම' යටතේ සරු කිරීම සඳහා නිදසුනකි,

1. ලුණුවලට අයඩීන් එක් කිරීම.
2. බටර්වලට විටමින් A හා D එක් කිරීම.
3. ඉවත්වයන විටමින් වර්ග නැවත කිරිපිටි වලට එක් කිරීම.
4. කිරිපිටිවලට කැල්සියම් එක් කිරීම.

33. පලතුරු බීම නිෂ්පාදනයේදී යොදාගනු ලබන පරිරක්ෂිත ද්‍රව්‍ය දෙකක් වනුයේ,

1. බෙන්සොයික් අම්ලය හා සෝඩියම් නයිට්‍රේට් ය.
2. සෝඩියම් මෙටාබයිසල්ෆයිට් හා සෝඩියම් නයිට්‍රේට් ය.
3. බෙන්සොයික් අම්ලය හා පොටෑසියම් මෙටා බයිසල්ෆයිට් ය.
4. පොටෑසියම් මෙටාබයිසල්ෆයිට් හා සෝඩියම් නයිට්‍රයිට ය.

(අටවෙනි පිටුව බලන්න)

34. ඉන්දීය ගව වරිග පිළිබඳ වඩාත්ම නිවැරදි වගන්තිය තෝරන්න
   1. සමේ ඇති ස්වේද ග්‍රන්ථි ප්‍රමාණය අඩු ය.
   2. ලෝම දිගින් අඩු ය.
   3. මොල්ලිය හා තැල්ල මනාව වර්ධනය වී නැත.
   4. සම චලනය කළ නොහැකි ය.

35. වර්ධන අවධියේ කිකිළියන් සඳහා ආලෝකය ලබා දිය යුතු කාල සීමාව,
   1.පැය 24 කි. 2. පැය 14 – 16 කි. 3. පැය 10 -12 කි. 4. පැය 8 – 10 කි.

36. කුකුළු පැටවුන්ට පළමු දිනයේ දී ආහාරයට ලබා දෙන ද්‍රව්‍ය වන්නේ,
   1. ආරම්භක සලාකය ය.
   2. වර්ධක සලාකය ය.
   3. විටමින් B හා ග්ලූකෝස් ය.
   4. සුනු සහල් හා සිප්පි කටු ය.

37. කිරිපිටිවලට තිරිඟු පිටි එකතු කළ විට එය හඳුනා ගැනිමට යොදා ගන්නේ,
   1. අයඩින් ය.
   2. ග්ලිසරින් ය.
   3. පිනොප්තලින් ය.
   4. ලිට්මස් ය.

38. සත්ත්ව ආහාර සලාකයක් පිළියෙළ කිරීමේ දී සලකා බලන සාධක වන්නේ,
   1.සතාගේ උස , බර හා වයස ය.
   2. සතාගේ වයස හා බර ය.
   3. සතාගේ වයස හා දේශගුණික කලාපය ය.
   4. සතාගේ බර හා ඇති කරනු ලබන ආකාරය ය.

39. අපූති තත්ත්ව යටතේ ආහාර ඇසුරුම් කිරීමේ දී,
   1. ආහාර ඇසුරුම් තුළ ඇති වාතය සියල්ල ඉවත් කරයි.
   2. ආහාර ඇසුරුම තුළ ඇති වාතය ඉවත් කර නයිට්‍රජන් වායුව පුරවයි.
   3. ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම ඉහළ උෂ්ණත්වයකට පත් කරයි.
   4. අඩු උෂ්ණත්ව තත්ත්ව යටතේ ගබඩා කළ යුතුයි.

40. ප්‍රයෝජන අනුව ගොවිපළ සතුන් වර්ගීකරණය කළ සටහනක් පහත දැක්වේ.

	සත්ව වර්ගය	සත්ව වරිගය	ප්‍රයෝජනය
A	ගව	අයර්ෂයර්	කිරි ලබා ගැනීම
B	කුකුළු	හර්බර්ඩ්	බිත්තර නිෂ්පාදනය
C	ගව	සහිවාල්	මස් ලබා ගැනීම
D	කුකුළු	ලෝමාන්	මස් නිෂ්පාදනය

ඉහත සටහන අනුව නිවැරදි ගැලපීම වන්නේ,
1. A හා B පමණි 2. B හා C පමණි 3. C හා D පමණි 4. A හා D පමණි

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

1. පහතරට වියළි කලාපයේ ගොවීන් පිරිසක් විසින් තම බෝග නිෂ්පාදන හා සත්ත්ව නිෂ්පාදන අලෙවි කිරීමට අවස්ථා සලසා ගැනීමේ අරමුණින් ගොවි සමිතියක් පිහිටුවා ගන්නා ලදී.

(i) (a) මෙම කලාපයට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රමය නම් කරන්න.
(b) මෙම කලාපයට ලැබෙන උපරිම වාර්ෂික වර්ෂාපතනය කොපමණ ද ?

(ii) (a) මෙම කලාපයේ ගොවීන් බහුලව වගා කරන කුකර්බිටේසියේ කුලයට අයත් එළවළු හා පලතුරු බෝගයක් බැගින් ලියන්න.
(b) කුකර්බිටේසියේ කුලයේ බෝගවල ඵලවලට හානි කරන පළිබෝධයෙකු නම් කරන්න.

(iii) (a) මෙම කලාපයේ බහුලව ව්‍යාප්තව ඇති පස් කාණ්ඩය ලියන්න.
(b) එම පස් වර්ගයේ විශේෂ ලක්ෂණයක් ලියන්න.

(iv) (a) අතිරික්ත එළවළු අස්වැන්න අපතේ යෑම වළක්වා ගැනීම සඳහා එම එළවළු පරිරක්ෂණය කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.
(b) පරිරක්ෂණය කළ එළවළු වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ දී ලේබල් කිරීම අවශ්‍ය වේ. එවැනි ලේබලයක ඇතුළත් කළ යුතු ප්‍රධාන කරුණු දෙකක් ලියන්න.

(v) (a) බෝගවගාවේ දී යොදා ගන්නා බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමට භාවිත කළ හැකි ක්‍රමයක් ලියන්න.
(b) බිත්තර වීවල තිබිය යුතු අවම ප්‍රරෝහණ ප්‍රතිශතය ලියන්න.

(vi) (a) මෙම කලාපයේ නිදැලි ක්‍රමයට ඇති කිරීමට යෝග්‍ය කිරි සඳහා සුදුසු එළගව වරිග දෙකක් ලියන්න.
(b) මෙම ගොවීන්ට, නැවුම් කිරි පරිරක්ෂණය කර අලෙවි කළ හැකි අකාර දෙකක් සඳහන් කරන්න.

(vii) (a) වී වගාවේ දී බහුලව දැකිය හැකි ඒක බීජ පත්‍රී වල් පැළෑටි දෙකක් ලියන්න.
(b) කිරි වදින අවධියේ පවතින වී වගාවක ළපටි බීජවලට හානි කරන ප්‍රධාන කෘමියා නම් කර, එම කෘමියාගේ රූපාන්තරණ ආකාරය ඇඳ දක්වන්න.

(viii) හේන් ගොවිතැන වියළි කලාපයේ බහුලව දැකිය හැකි ය. හේන් ගොවිතැන නිසා ඇති වන ප්‍රධාන පාරිසරික ගැටලු දෙකක් ලියන්න.

(ix) (a) පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(b) කොළ පොහොර සඳහා යොදා ගත හැකි ශාක වර්ග දෙකක් සඳහන් කරන්න.

(x) (a) නිවැරදි ලෙස බිම් සකස් කිරීමේ අරමුණු දෙකක් ලියන්න.
(b) ද්විතියික බිම් සකස් කිරීම සඳහා යොදා ගන්නා උපකරණ දෙකක් නම් කරන්න.

(මුළු ලකුණු 20)

(දෙවැනි පිටුව බලන්න)

2. (i) (a) බෝග වගාව සඳහා උෂ්ණත්වයේ හිතකර බලපෑම් දෙකක් දක්වන්න.
(b) පාංශු වයනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ii) හරිත විප්ලවය සමඟ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් තුනක් ලියා දක්වන්න.

(iii) (a) පාංශු ඛාදනය යනු කුමක්ද?.
(b) පාංශු ඛාදනය නිසා වගා බිමට සිදු විය හැකි හානි දෙකක් ලියා දක්වන්න.

(මුළු ලකුණු 10)

3. රෝපණ ද්‍රව්‍ය තවාන් කර පැළ ලබා ගැනීමෙන් නීරෝගී හා ඒකාකාර වගාවක් ලබාගත හැකි ය.

(i) (a) පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිත කර සකසා ගත හැකි තවාන් බඳුන් ආකාර දෙකක් නම් කරන්න.
(b) වැටි සහ කානුවල වගා කරන බෝග වර්ග තුනක් නම් කරන්න.
(c) උස් වූ පාත්තියක සම්මත පළල ,උස හා පාත්ති දෙකක් අතර පරතරය සඳහන් කරන්න.

(ii) (a) බෝග සංස්ථාපන උපකරණ භාවිතා කිරීමේ වාසියක් සඳහන් කරන්න.
(b) බෝග සංස්ථාපන උපකරණ ප්‍රධාන ආකාර දෙක නම් කරන්න .

(iii) (a) විද්‍යාත්මක බෝග වර්ගීකරණය යනු කුමක්ද?
(b) පහත බෝග අයත් කුල සඳහන් කරන්න.

- කැරට්
- දඹල
- පුවක්
- තක්කාලි

(මුළු ලකුණු 10)

4. බෝග අස්වනු පහත වැටීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස පළිබෝධ හානි හැඳින්විය හැකි ය.

(i) (a) ආක්‍රමණශීලී වල් පැළෑටි දෙකක් ලියන්න.
(b) වල්පැළෑටිවල පොදු ලක්ෂණ හතරක් ලියන්න.

(ii)

(a) මෙම රූපයේ සිටින පළිබෝධ කෘමියා නම් කරන්න.
(b) මෙම කෘමියාගේ හානියේ ස්වභාවය ලියන්න.

(තුන්වෙනි පිටුව බලන්න)

(iii) (a) ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇති කරනු ලබන රෝග කාරක ජීවියා නම් කරන්න.

(b) එම රෝගයේ රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(මුළු ලකුණු 10)

5. බෝගයකින් සරු අස්වැන්නක් ලබා ගැනීම සඳහා ජලය සහ පෝෂක සෘජුවම බලපායි.

(i) (a) පසෙන් ජලය ඉවත්වන ප්‍රධාන ක්‍රම දෙකක් නම් කරන්න.

(b) පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කර, එම ක්‍රම යෙදීමට සුදුසු බෝගය බැගින් ඒ ඉදිරියෙන් ලියන්න.

(ii) (a) පහත සඳහන් පෝෂක ඌන වූ විට ශාක පෙන්වන ඌනතා ලක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

- පොස්පරස්
- පොටෑසියම්

(b) බිංදු ජල සම්පාදනයේ දී මතුවිය හැකි ගැටළු දෙකක් සඳහන් කරන්න.

(iii) (a) භූ විෂමතාව අනුව යොදාගත හැකි ජලවහන කාණු රටා දෙකක් නම් කරන්න.

(b) දුර්වල ජලවහනය නිසා බෝගවලට සිදුවන බලපෑම් දෙකක් ලියන්න.

(මුළු ලකුණු 10)

6. විවිධ ශාක ප්‍රචාරණ ක්‍රම හා විවිධ වගා ක්‍රම ඔස්සේ බෝග වගා කරමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව වැඩි අස්වැන්නක් ලබා ගැනීම මඟින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවිය හැකිය.

(i) (a) පටක රෝපණයේ වාසි දෙකක් ලියන්න.

(b) වායව අතුබැඳීම යටතේ නව පැළයක් ලබා ගන්නා ආකාරය පියවර හතරකින් ලියන්න.

(ii) (a) තාවකාලික ආරක්ෂිත වගා ව්‍යුහ සැකසීමේ අරමුණු දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාව තුළ පොලිතින් ගෘහ භාවිතයේ දී ඇතිවිය හැකි අවාසියක් ලියන්න.

(iii) (a) වැඩි දියුණු කළ වී ප්‍රභේදවල යහපත් ලක්ෂණ හතරක් දක්වන්න.

(b)වැඩි දියුණු කළ වී ප්‍රභේද දෙකක් නම් කර, ඒවායේ වයස සඳහන් කරන්න.

(මුළු ලකුණු 10)

7. සමබල පෝෂණය, රෝග වළක්වා ගැනීම හා සත්ත්ව නිවාස මනාව නඩත්තු කිරීම යන කාර්යයන් මඟින් ගොවිපොළ සතුන්ගේ නිෂ්පාදනය වැඩි කර ගත හැකි ය.

(i) (a) සත්ත්ව පාලනය දියුණු කිරීම සඳහා රාජ්‍ය අංශයෙන් ලබා දෙන පහසුකම් දෙකක් ලියන්න.

(b) ගව පාලනයේ දී බහුල ව යොදා ගන්නා 'තෙත් දළ ආහාර' හා 'වියළි දළ ආහාර' සඳහා නිදසුනක් බැගින් ලියන්න.

(ii) (a) සත්ත්ව නිවාස තුළ රෝග ව්‍යාප්ත වීම පාලනය කිරීමට ගත හැකි පියවර දෙකක් ලියන්න.

(b) පිරිසිදු යුරෝපීය ගවයින් ඇති කිරීමට සුදුසු 'ගවපාලන කලාපය' කුමක්ද?

(c) දිනක් වයසැති කුකුළු පැටවුන්ට වැළඳෙන බැක්ටීරියා රෝගයක් නම් කරන්න.

(iii) (a) සත්ත්ව නිවාස සකස් කිරීමට යොදා ගන්නා භූමියේ තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

(b) ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වාසි දෙකක් ලියන්න.

(මුළු ලකුණු 10)

බහුවරණ ප්‍රශ්න - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර	නිපුණතා මට්ටම	ශ්‍රේණිය
01	4	1.4	10
02	3	2.1	10
03	1	2.1	10
04	4	3.1	10
05	3	3.1	10
06	3	3.1	10
07	4	3.3	10
08	2	4.1	10
09	4	5.3	10
10	1	5.3	10
11	3	6.2	10
12	2	6.2	10
13	3	7.2	10
14	3	7.3	10
15	3	8.1	10
16	2	8.2	10
17	4	9.1	10
18	1	9.3	10
19	3	9.2	10
20	4	10.1	10
21	2	10.2	10
22	3	1.3	11
23	4	1.5	11
24	2	1.1	11
25	3	2.2	11
26	2	2.2	11
27	3	3.1	11
28	3	4.2	11
29	3	5.1	11
30	3	7.2	11
31	1	6.1	11
32	3	7.3	11
33	3	7.1	11
34	2	8.2	11
35	3	8.7	11
36	3	8.9	11
37	1	10.1	11
38	2	8.3	11
39	3	9.1	11
40	4	8.2	11

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II
පිළිතුරු

01. (i) (a) ඊසාන දිග මෝසම **(ලකුණු** 1×1=1)

(b) 1750 mm **(ලකුණු** 1×1=1)

(ii) (a) ඵලවළු - වට්ටක්කා, කැකිරි, පිපිඤ්ඤා, පුහුල්, පතෝල, වැටකොළු
පලතුරු - කොමඩු , (පත්තක්කා)/සීනි කැකිරි **(ලකුණු**1/2×2=1)

(b) ඉල් මැස්සා **(ලකුණු** 1×1=1)

(iii) (a) රතු දුඹුරු පස **(ලකුණු** 1×1=1)
(b) රතු දුඹුරු වර්ණය / වැලි ලෝම වයනය /pH 5.5 – 7.0
කැටායන හුවමාරු ධාරිතාව වැඩිය **(ලකුණු** 1×1=1)

(iv) (a) වියළීම / ජෑම් සෑදීම (වට්ටක්කා/තක්කාලි)/ශීත කිරීම/සෝස් **(ලකුණු** 1/2×2=1)
(b) වෙළඳ නම/පොදු නම/නිෂ්පාදිත දිනය/කල් ඉකුත්වීමේ දිනය **(ලකුණු** 1/2×2=1)
ශුද්ධ බර/නිෂ්පාදකයාගේ තොරතුරු

(v) (a) ඍග්ඩෝල් ක්‍රමය, පෙට්‍රිදීසි ක්‍රමය **(ලකුණු** 1×1=1)
(b) 85 % **(ලකුණු** 1×1=1)

(vi) (a) සින්දි, සහිවාල් / දේශීය දෙමුහුම් වරිගය **(ලකුණු**1/2×2=1)
(b) මුදවාපු කිරි, යෝගට්, දියර යෝගට් **(ලකුණු** 1/2×2=1)

(vii) (a) ඒකබීජ පත්‍රී - කුඩමැට්ට, ගොජිරි, බජිරි, මාරුක්, බැලතණ, බටදැල්ල **(ලකුණු** 1/2×2=1)
(b) ගොයම් මකුණා (ගොයම් මැස්සා) **(ලකුණු** 1×1=1)



(ලකුණු 1×1=1)

(viii) (a) ජල උල්පත් සිදීයාම, වන විනාශය, ජෛව විවිධත්වය විනාශ වීම,
පාංශු ඛාදනය, වන සතුන් විනාශ වීම **(ලකුණු** 1/2×1=1)

(ix) (a) - සියළුම පෝෂක පදාර්ථ අඩංගු බැවින් පූර්ණ පොහොරකි.
- කැටායන හුවමාරු ධාරිතාව වැඩි කරයි. **(ලකුණු** 1/2×2=1)
- ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරයි
- පාංශු ව්‍යුහය හා ජල අවශෝෂණ ධාරිතාව වැඩි කරයි.

(b) - ග්ලිරිසීඩියා - එරබදු, ඇල්බීසියා **(ලකුණු**1/2×1=1)
- වල්සූරියකාන්ත - අඩනහිරියා

(දෙවෙනි පිටුව බලන්න)

(x) (a) - පසෙහි භෞතික තත්ත්වය දියුණු කිරීම
- පස බුරුල් කිරීම **(ලකුණු1/2×2=1)**
- පසෙහි ඇති ගල්මුල් ඉවත් කිරීම
- පළිබෝධ පාලනය
- පසට පොහොර මිශ්‍ර කිරීම

(b) උදැල්ල, පෝරු වර්ග, රේක්ක, රොටවේටරය, රිජරය **(ලකුණු1/2×2=1)**

(මුළු ලකුණු 20)

02. (i) (a) - බීජ ප්‍රරෝහණය සඳහා උෂ්ණත්වය වැදගත් වේ **(ලකුණු 1×2=2)**
- දඬු කැබලි මුල් ඇද්ද වීමට
- පාංශු ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වයට
- ප්‍රභාසංස්ලේෂණය ප්‍රශස්ත ලෙස සිදු වීමට

(b) පාංශු වයනය යනු පසේ පවතින විවිධ විශාලත්වයෙන් යුත් ඛනිජ අංශුවල විවිධ ප්‍රමාණවේ.
(ලකුණු 1×1=1)

(ii)

- කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ලබා දෙන බීජ වර්ග හඳුන්වා දීම
- කෘෂි රසායනික ද්‍රව්‍ය හඳුන්වා දීම
- ගොවිපොළ යාන්ත්‍රිකරණ වැඩි වීම
- වගා කන්න දෙකක් හඳුන්වා දීම
- අතිරික්ත නිෂ්පාදනය අලෙවිය

(ලකුණු 1×3=3)

(iii) (a) පාංශු ඛාදනය යනු, පාංශු ඛාදන කාරකයක් මඟින් පස් අංශු ඉවත් කර, සෝදාගෙන ගොස්, වෙනත් ස්ථානයක තැන්පත් වීම ය . **(ලකුණු 2×1= 2)**

(b) මතුපිට සරු පස සෝදායාම, ශාකවල මුල් වලට හානි වීම, පසේ මතුපිට කානු ඇතිවීම, පස තුළට ජලය අවශෝෂණය අඩු වීම, කුඩා පැළ ගැලවී යාම **(ලකුණු 2×1= 2)**

03. **(i)** (a) පොල් කටු, පොල් ලෙලි, කෙසෙල් පට්ට බඳුන්, කිරි හට්ටි **(ලකුණු ½×2=1)**

(b) බතල, රටකජු, තක්කාලි **(ලකුණු ½×3=1 1/2)**

(c) සම්මත පළල - 1m **(ලකුණු ½×3=1 1/2)**
උස - පිහිටි බිමෙහි මට්ටමට වඩා - 15cm
කාණු දෙකක් අතර පරතරය - 30 cm

(ii) (a) බෝග සංස්ථාපනයට ගත වන කාලය හා ශ්‍රමය අඩු කර ගැනීමට හැකි වීම
පොහොර යෙදීම, වල් නෙළීම වැනි කටයුතු සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට පහසු වේ
(ලකුණු 1×2=2)

(b) (1) බීජ වප්කර
(2) පැළ සිටුවීමේ යන්ත්‍ර

(ලකුණු ½ ×2=1)

(තුන්වෙනි පිටුව බලන්න)

(iii) (a) ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ සලකා බලා විද්‍යාත්මක ආකාරයට සිදු කර ඇති වර්ගීකරණය වේ. **(ලකුණු** 1×1=1**)**

(b)

- අම්බිලිෆරේ.
- ෆැබේසියේ
- ඇරිකේසියේ
- සොලනේසියේ

(ලකුණු 1/2×4=2**)**

04. (i) (a) ගඳපාන, පාතිනියම්, විඩේලියා, ජපන් ජබර, සැල්වීනියා **(ලකුණු** 1×2=2**)**

(b) - ශීඝ්‍රයෙන් පැතිරේ
- අහිතකර කාලවල දී නොනැසී පැවතීමේ හැකියාව
- පළිබෝධ හානිවලට ඔරොත්තු දීම
- ජීවන චක්‍ර කෙටි වීම **(ලකුණු** 1/2×4=2**)**

(ii) (a) රතු පොල් කුරුම්ණියා. **(ලකුණු** 1×1=1**)**

(b) අවු. 3 – 8 අතර පොල් ශාකවල කඳ තුළ සිටිමින් කඳ හාරා ආහාරයට ගැනීම

(ලකුණු 1×2=2**)**

(iii) (a) කොලෙටොට්‍රිකම් දිලීරය **(ලකුණු** 1×1=1**)**

(b) රෝග ලක්ෂණ - පත්‍ර මත අක්‍රමවත් කහ දුඹුරු , තද දුඹුරු හෝ කලු පුල්ලි ඇති වීම

- පුල්ලි එකිනෙක යා වී කලු දුඹුරු පාට විශාල ප්‍රදේශ බවට පත්වීම
- ඵල මත ජලය උරාගත් පෙනුමැති රවුම් පුල්ලි ඇති වී පසුව කළු දුඹුරු පැහැති වීම
- පුල්ලි පරණ වන විට ලපයේ මැද රෝස පැහැති දිලීර බීජාණු ඇති වීම

(ලකුණු 1×2=2**)**

05. (i) (a) උත්ස්වේදනය, වාෂ්පීකරණය, ගැඹුරු වැස්සීම **(ලකුණු** 1/2×2=1**)**

(b) බේසම් ක්‍රමය - පලතුරු වර්ග **(ලකුණු** 1/2×4=2**)**
ඇලි හා වැටි ක්‍රමය - මිරිස් , තක්කාලි

(ii) (a) පොස්පරස් - ශාකයේ වර්ධනය බාල වේ, මුල් සංඛ්‍යාව අඩුවී වර්ධනය බාල වීම, සමහර ශාකවල මේරූ පත්‍ර දම් පැහැ වේ, පත්‍ර පහසුවෙන් හැළේ. **(ලකුණු** 1×1=1**)**

පොටෑසියම් - පත්‍ර දාර කහ පාට වේ, පසුව පත්‍ර දාර පිළිසුණු ස්වභාවයක් ගනී. **(ලකුණු** 1×1=1**)**

(b) අතුරුයත් ගෑමේ කටයුතුවල දී නල පද්ධතියට හානි සිදු වේ. නළ පද්ධතියේ ඇති සිදුරුවල පස් හිරවීම හෝ ගල් කුඩා ගල්කැට හිරවීම නිසා එම ස්ථානයෙන් ඉදිරියට ජලය ගමන් නොකරයි.

(ලකුණු 2×1=2**)**

(හතරවෙනි පිටුව බලන්න)

(iii) (a) හෙරින්බෝන් කානු (ලකුණු 2×1=2)

සමාන්තර කානු (ග්‍රීඩ් අයන්)

(b) පසෙහි වාතනය දුර්වල වීම නිසා මුල් කුණු වී යාම , ශාක පැළ ඇද වැටීම, පැළ මිය යාම

(ලකුණු ½ ×2=1)

06.

(i) (a) - අනෙකුත් ප්‍රචාරණ ක්‍රමවලට සාපේක්ෂව අධික පැළ සංඛ්‍යාවක් ලබාගත හැකි වීම.

- පැළ ගබඩා කිරීම හා ප්‍රවාහනය පහසු වීම.
- වයිරස් රෝග ව්‍යාප්තිය අඩු වීම. (ලකුණු ½ ×2=1)

(b) - ඉහළ කොටසක ඇති අත්තක පොතු වලයක් ඉවත් කිරීම

- රෝපණ මාධ්‍ය සකසා ගැනීම.(කොහු බත් හා මතුපිට පස් හෝ කොම්පෝස්ට්)
- පොතු වලය ඉවත් කළ ස්ථානයට රෝපණ මාධ්‍ය තබා පොලිතින් කැබැල්ලකින් ඔතා දෙකෙළවර ගැට ගැසීම
- ජල සම්පාදනය අවශ්‍ය නොවන අතර මුල් ඇදීමෙන් පසු මව් ශාකයෙන් වෙන්කර ගැනීම

(ලකුණු 2×1=2)

(ii) (a) - පැළ හෝ වර්ධක කොටස් සිටුවීමෙන් පසු දැඩි සූර්ය රශ්මියෙන් ආරක්ෂා කර ගැනීම

- බීජ ප්‍රරෝහණය වේගවත් කර ගැනීම
- ශාක කැබලි මුල් ඇදීම වේගවත් කිරීම (ලකුණු ½×2=1)

(b) - ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල උෂ්ණත්වය ඉහළ යාම

- තෙත් කලාපයේ දී වර්ෂාව හේතුවෙන් පොලිතීනය මත ඇල්ගී වර්ධනය වීම

(ලකුණු 2×1=2)

(iii) (a) ශාක උසින් අඩුය.

ඇද වැටීමට ඔරොත්තු දේ.

අස්වැන්න වැඩිය.

පදුරු දැමීම වැඩිය.

රසායනික පොහොරවලට ප්‍රතිචාරය වැඩිය.

ධාන්‍ය පිදුරු අනුපාතය වැඩිය (ලකුණු 1 /2×4=2)

(b) Bg - 300 - මාස 3

Bg – 351 – මාස 3 ½

Bg – 360 – මාස 3 ½

H4- මාස 4

Bg – 450 – මාස 4 ½ (ලකුණු 1×2=2)

(පස්වෙනි පිටුව බලන්න)

07. (i) (a) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවෙන් සත්ත්ව පාලනය දියුණුකිරීම සඳහා උපදෙස් ලබා දීම, උසස් සතුන් හඳුන්වා දීම, පශු වෛද්‍ය නිලධාරීන් ලබා දීම **(ලකුණු 2×1=2)**

(b) තෙත් දළ ආහාර - තෘණ, රනිල, සෛලේජ් **(ලකුණු 1×2=2)**
වියළි දළ ආහාර - පිදුරු, වියළි තෘණ,බෝග අවශේෂ

(ii) (a) - නිවාසය දොරටුව අසල පා දෝවනයක් සැකසීම **(ලකුණු 1 /2×2=1)**
- ආගන්තුකයන් ඇතුලුවීම වැළැක්වීම
- නිවාසය තුළ පවිත්‍රතාව පවත්වා ගැනීම
- ආහාර හා ජල බඳුන් දිනපතා පිරිසිදු කිරීම
- රෝගී සතුන් ඉවත් කිරීම

(b) උඩරට කලාපය **(ලකුණු 1×1=1)**
(c) පුල්ලෝරම් රෝගය **(ලකුණු 1×1=1)**

(iii) (a) සමතල වීම/ තද භූමියක් තිබීම/ ජලවහනය දියුණු වීම/ වාහන පහසුකම් තිබීම/ සූර්යාලෝකය හොඳින් ලැබීම
(ලකුණු 1/2×2=1)

(b) අඩු ඉඩකඩ වැඩි සතුන් ප්‍රමාණයක් ඇති කිරීම/ සතුන් ආරක්ෂිත ය/ නිෂ්පාදනය වැඩි ය/ බිත්තර එකතු කිරීම පහසු ය
(ලකුණු 1×2=2)